ප්‍රතිපෝෂණ කාර්යය පත්‍රිකා 01

# බුද්ධ ධර්මය



නිපුණතා මට්ටම් 11.2.2 ,11.2.1 ,10.6.4 ,11.8.1

අ.පො.ස. ( සා.පෙළ) උපකාරක කාර්යය පත්‍රිකා

ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

## ආදර්ශ ප්‍රශ්ණ පත්‍ර 1

1. **''අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති''** යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

2. ඉහත ගාථාවේ අර්ථය ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

3. ''**තංච කම්මං කතං සාධු** යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

4. ඉහත ගාථාවේ අර්ථය ලියන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

5. ධම්මපද ගාථා වලින් ලබා දෙන ආදර්ශ පහක් ලියන්න.

1.....................................................................................................................

2.....................................................................................................................

3.....................................................................................................................

4.....................................................................................................................

5.....................................................................................................................

6. දස පාරමිතා නම් කර එයට අදාළ ජාතක කතා නම් කරන්න.

1.....................................................................................................

2.....................................................................................................

3.....................................................................................................

4.....................................................................................................

5.....................................................................................................

6.....................................................................................................

7.....................................................................................................

8.....................................................................................................

9.....................................................................................................

10...................................................................................................

7. චතුරාර්යය සත්‍යය නම් කරන්න.

1 .................................................................................................

2 ..............................................................................................

3 .................................................................................................

4 ....................................................................................................

8. ඉහත සත්‍ය අතරින් එක් සත්‍යයක් කෙටියෙන් හඳුන්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

9. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු පෙන්වා දෙන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

.......................................................................................................................

10. පහත සඳහන් ප්‍රශ්න සඳහා පළමු සංගායනාව ඇසුරින් පිළිතුරු සපයන්න.

1.මූලිකත්වය ගත් රහතන් වහන්සේ නම් කරන්න.

....................................................................................................

2.අනුග්‍රහය දැක්වූ රජතුමා නම් කරන්න.

....................................................................................................

3.පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.

.....................................................................................................................

4.බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුව ද?

.....................................................................................................................

5.කොපමණ කාලයක් සංගායනාව පැවැත්වූයේ ද?

....................................................................................................................

6.සහභාගීවූ රහතන් වහන්සේලා ගණන ලියා දක්වන්න.

...................................................................................................................

7.සංගායනාව හඳුන්වන නම ලියා දක්වන්න.

.....................................................................................................................

8.පළමු ධර්ම සංගායනාව පැවැත්වීමේ ප්‍රතිපල පහක් ලියා දක්වන්න.

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

ආදර්ශ ප්‍රශ්ණ පත්‍ර 1

පිළිතුරු

1. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති

අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති

සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤෝ මඤ්ඤං විසෝධයේ

2. යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය.

යමෙකු පව් නොකළහොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය.

පිරිසිදුකම හෝ අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය.

එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

3. තඤ්ච කම්මං කතං සාධු

යං කත්වා නානුතප්පති

යස්ස පතීතෝ සුමනෝ

විපාකං පටිසේවති

4.යම් ක්‍රියාවක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේ ද, යමක විපාකය

ප්‍රීතියෙන් හා සොම්නසින් යුතු ව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවල නිරත

විය යුතු ය.

5. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් එහි ඇතුළත්ය.

- ධම්මපද ගාථා මගින් ඉදිරිපත් කරන ජීවිතාදර්ශ ජාති, ආගම් ආදී කිසිදු බේදයකින් තොරව සමස්ත මානව වර්ගයාට ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ආචාර ධර්ම වේ.
- ධම්මපදයේ එන ගාථා ධර්මයෙහි ඇතුළත් උපදෙස් මගින් හොඳ නරක හඳුනා ගැනීමට මඟ පෙන්වයි.
- සිතේ සන්සුන් බව ඇති කර ගැනීම හා වීර්යවන්තව ක්‍රියා කොට ජීවිතය ජය ගැනීමට උපදෙස් ලබා දෙයි.

- සහජීවනයෙන් ක්‍රියා කිරීමට අල්පේච්ඡ බව ඇති කර ගැනීමට චාම් ජීවිතයක් ගත කිරීමට ඉතා වටිනා උපදෙස් ලබා දෙයි.

6. 1. දාන පාරමිතාව - වෙස්සන්තර ජාතකය, සිවි ජාතකය, සස ජාතකය
   2. ශීල පාරමිතාව සීල වීමංස ජාතකය
   3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව - මඛාදේව ජාතකය
   4. ප්‍රඥා පාරමිතාව - උම්මග්ග ජාතකය
   5. වීර්ය පාරමිතාව - වණ්ණුපථ ජාතකය
   6. ක්ෂාන්ති පාරමිතාව - ක්‍ෂාන්තිවාදී ජාතකය
   7. සත්‍ය පාරමිතාව - වට්ටක ජාතකය
   8. අධිෂ්ඨාන පාරමිතාව - තේමිය ජාතකය
   9. මෛත්‍රී පාරමිතාව - මහා කපි ජාතකය
   10. උපේක්ෂා පාරමිතාව ලෝමහංස ජාතකය

7. 1. දුක්ඛ ආර්ය සත්‍යය
   2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
   3. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය
   4. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය

8. - දුක්ඛ ආර්ය සත්‍යය - ඉපදීම, වයසට යාම, ලෙඩවීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියන් හා එක්වීම, ආදී දුක පිළිබඳ අවබෝධයයි.

- දුක්ඛ සමුදය ආර්ය සත්‍ය - පුනර්භවය ඇතිකරන, ඇල්මෙහි සතුට සහිත වූ ඒ ඒ තැන සිත අලවන තෘෂ්ණාව දුකට හේතුවයි. කාම, භව, විභව යන ත්‍රිවිධ තෘෂ්ණාවයි. සසර නැවත නැවත ඉපදීමට හේතුව තෘෂ්ණාවයි.

- දුක්ඛ නිරෝධ අර්ය සත්‍යය - සසර දුක ඇති කරන එකී තෘෂ්ණාව ඉතිරි නොවන ලෙස නැති කිරීම, නොඇලීම, හෙවත් විරාගය,

නිරෝධය සියලු ආශාවන් අත් හැරීම, සියලු දෙයින් නිදහස් වීම, ආලය දුරු කිරීම, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.

- දුක්ඛ නිරරෝධ ගාමිණී පටිපදා ආර්යය සත්‍යය - දුකින් මිදීමේ මගයි. එනම් අංග අටකින් යුක්ත වූ ආර්ය මාර්ගයයි. මධ්‍යම ප්‍රතිපදාවයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන්නයි.

9. • සුභද්‍ර භික්ෂූන් වහන්සේගේ නුසුදුසු ප්‍රකාශය

- විසිරී තිබූ ධර්මය ඒකරාශී කිරීම

10. 1. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

2. අජාසත්ත රජතුමා

3. රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහා

   ද්වාරය අභියස

4. මාස තුනකට පසු

5. මාස හතයි

6. 500යි

7. පංචසතිකා සංගීතිය

8.

- විසිරී තිබූ ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම.
- ධර්ම විනය කොටස්කර භාණක පරපුරකට පැවරීම.
- විනය පස් ආකාරයකින් සංග්‍රහ කිරීම.

- නව විනය නීති නොපැන වීමට ප්‍රතිඥා දීම.

- පැන වූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම.